ලකුණු බෙදී යාම

I කොටසේ ප්‍රශ්නය ද II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක්ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1. ප්‍රශ්නය

(i) කොටස ප්‍රශ්න	= ලකුණු **01**යි.
(ii) සිට **(x)** දක්වා කොටස්වලට ලකුණු **03** බැගින් **03×09**	= ලකුණු **27**යි.
I කොටසට නියමිත මුළු ලකුණු ප්‍රමාණය	ලකුණු **28**යි.

II කොටස

ප්‍රශ්න අංක **1** සිට **7** තෙක්

(i) වන කොටසට ලකුණු	= ලකුණු **04**යි.
(ii) වන කොටසට ලකුණු	= ලකුණු **06**යි.
(iii) වන කොටසට ලකුණු	= ලකුණු **08**යි.
	ලකුණු **18**යි.

ප්‍රශ්න පත්‍රයේ **I** කොටසට	ලකුණු 28යි
ප්‍රශ්න පත්‍රයේ **II** කොටසට	ලකුණු 72යි
	මුළු ලකුණු 100යි

❖ ❖ ❖

Past Papers Wiki

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

1.

(i) සිගාලක සූත්‍රය / සිගාලෝවාද සූත්‍රය

(ලකුණු 01යි)

(ii)

- මානව සමාජයේ ව්‍යුහය
- සමාජ සම්බන්ධතා
- මිනිසාගේ ආර්ථික චර්යාව
- දේශපාලන චර්යාව ආදී අදාළ කරුණු

(නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3ක් සඳහා 01×3 = ලකුණු 03යි.)

(iii)

- වියත්තෝ - වියත් බව
- විනීතෝ - විනීත බව
- විසාරදෝ - විශාරද බව
- ධම්මධරෝ - ධර්මධර බව
- ධම්මානුධම්ම පටිපන්නෝ - ධර්මානුධර්ම ප්‍රතිපන්න බව
- ප්‍රතිවාදීන් කරන වැරදි විවරණ නිවැරදි කිරීමට සමත් බව

(මේ අතරින් එක් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3ක් සඳහා 01×3 = ලකුණු 03යි.)

(iv)

- බ්‍රහ්මා - බ්‍රහ්ම
- පුබ්බාචරිය - පෙර ගුරුවරු
- පුබ්බදේව - පෙර දෙවිවරු
- ආහුණෙය්‍ය - දුර බැහැර සිට වුවත් යමක් ගෙනවිත් පිදීමට සුදුසු

මෙහි පාලි යෙදුම ම අපේක්ෂා කෙරේ.

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3ක් සඳහා 01×3 = ලකුණු 03යි.)

(v)

- මනෝමය - මනෝමය සිරුරින් යුක්ත
- ආකාසචාරී - අහසෙහි හැසිරෙන
- පීතිභක්ඛා - ප්‍රීතිය ආහාරය කරගත්
- සයංපභා - සිරුරෙන් ආලෝකය විහිදුවන

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3ක් සඳහා 01×3 = ලකුණු 03යි.)

(vi)

- නුදුන් දේ ගැනීමෙන් වැළකීම - අදින්නාදානා පටිවිරතො
- දුන් දේ පමණක් ගැනීම - දින්නදායී
- දුන් දේ පමණක් කැමතිවන - දින්නපාටිකංකි
- සොර සිත් නැතිව පිරිසිදු සිතින් යුක්තව - අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3ක් සඳහා 01×3 = ලකුණු 03යි.)

(vii)

- ජාතිය
- කුලය
- ගෝත්‍රය
- වර්ණය

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3ක් සඳහා 01×3 = ලකුණු 03යි.)

PAST PAPERS WIKI

(viii)

- මගධ ජනපදය
- කෝසල ජනපදය
- වත්ස ජනපදය
- අවන්ති ජනපදය

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3ක් සඳහා 01×3 = ලකුණු 03යි.)

(ix)

- සෞඛ්‍යය පිරිහීම
- කීර්තිය පිරිහීම
- විලිබිය හා සදාචාර විචක්ෂණය පිරිහීම
- පාපක්‍රියාවන්ට පෙළඹීම
- දේපළ හා අඹුදරුවන් අනාරක්ෂිත වීම

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3ක් සඳහා 01×3 = ලකුණු 03යි.)

(x)

- අත්ථි සුඛ - ධනය මට ඇතැයි යන සැපය
- භෝග සුඛ - ධනය පරිභෝග කිරීමේ සැපය
- අණන සුඛ - මා ණය නැතැයි යන සැපය
- අනවජ්ඣ සුඛ - ජීවන පැවැත්ම නිවැරදිය යන සැපය

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3ක් සඳහා 01×3 = ලකුණු 03යි.)

II කොටස

1.

(i)

- මානව විද්‍යාව
- සංස්කෘතික මානව විද්‍යාව
- සමාජ මනෝ විද්‍යාව
- මානව වංශ විද්‍යාව
- නීතිය

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4ක් සඳහා 01×4 = ලකුණු 04යි.)

(ii)

- කුසල් , අකුසල්
- හොඳ , නරක
- යුතුකම් , අයුතුකම්
- පින් , පව්
- ධර්මය , අධර්මය
- සාර , අසාර

(නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 6ක් සඳහා 01×6 = ලකුණු 06යි.)

(iii) ඉන්ද්‍රිය ගෝචර කරුණු පදනම් කොටගෙන වාස්තවිකව කරුණු විග්‍රහ කිරීමට වඩා කුසල් - අකුසල් හොඳ - නරක, යුතුකම් - අයුතුකම්, පින් - පව්, ධර්මය - අධර්මය, සාර - අසාර ආදී කරුණු කෙරෙහි ම අවධානය යොමු කෙරෙන, සදාචාර, හැඟිම්බර බව, ගුණාගුණ විනිශ්චය හෙවත් සාර විනිශ්චය ඇතුළත් වන පරිදි සමාජය, දේශපාලනය, ආර්ථිකය, පරිසරය ආදී විෂය ක්ෂේත්‍ර පිළිබඳව අධ්‍යයනය කිරීම සමාජ දර්ශනය යැයි කියනු ලැබේ.

බුදුසමයේ ධර්ම - විනය, සදාචාර ධර්ම, සිරිත් විරිත්, සාර-අසාර ධර්ම, යුතුකම්-වගකීම් ආදී විවිධ ධර්මානුකූල නිර්ණායක ප්‍රකාශිත අග්ගඤ්ඤ, සිඟාලක, කරණීයමෙත්ත, ව්‍යග්ඝපජ්ජ, අණන, පත්තකම්ම ආදී සූත්‍ර දේශනා පදනම් කොට සමාජ ව්‍යුහය, සමාජ පැවැත්ම හා පරිණාමය, ආර්ථික, දේශපාලන, මානව සමාජය හා පරිසරය, සමාජ ප්‍රශ්න ආදී විවිධ පැතිකඩ පිළිබඳ අධ්‍යයනය කිරීම බෞද්ධ සමාජ දර්ශනයේ සුවිශේෂතාව වේ.

මේ ඇසුරින් පිළිතුර සකස් විය යුතුය.

සමාජ දර්ශනය හැඳින්වීම	= ලකුණු 04යි
බෞද්ධ සමාජ දර්ශනයේ සුවිශේෂිතාවයට	= ලකුණු 04යි
	ලකුණු 08යි

Past Papers Wiki

2.

(i)

- භික්ඛු / භික්ෂු
- භික්ඛුණී / භික්ෂුණී
- කාමභෝගි උපාසක / බ්‍රහ්මචාරී උපාසක
- කාමභෝගි උපාසිකා / බ්‍රහ්මචාරී උපාසිකා

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4ක් සඳහා 01×4 = ලකුණු 04යි.)

(ii)

- පුබ්බ දිසා / පෙරදිශාව = මව්පිය-දූ දරු පිරිස
- දක්ඛිණ දිසා / දකුණු දිශාව = ගුරු-ශිෂ්‍ය පිරිස
- පච්ඡිම දිසා / පශ්චිම, බටහිර දිශාව = ස්වාමි-භාර්යා පිරිස
- උත්තර දිසා / උතුරු දිශාව = මිත්‍ර - අමාත්‍ය පිරිස
- හෙට්ඨා දිසා / යට දිශාව = සේව්‍ය - සේවක පිරිස
- උද්ධං / උඩ දිශාව = ගිහි-පැවිදි මහණ බමුණ පිරිස

(01×6 = ලකුණු 06යි.)

(iii)

- ගෞරවයෙන් ක්‍රියාකිරීමෙන්
- අගෞරව නොකිරීමෙන්
- දුසිරිතෙහි නොයෙදීමෙන්
- ඉසුරු පවරා දීමෙන්
- අලංකාර ආභරණ ආදිය ගෙනදීමෙන්

ස්වාමියා විසින් භාර්යාවට ඉහත කරුණු පහෙන් යුතුකම් ඉටු කෙරෙන කල්හි භාර්යාව ද ස්වාමියා වෙත කරුණු පහකින් සිය සැලකිල්ල (වගකීම) ලබා දෙයි.

- නිවසේ යුතුකම් මනාව සැලසුම් කිරීම
- පිරිවර ජනයාට නිසිසේ සංග්‍රහ කිරීම
- දුසිරිතෙහි නොයෙදීම
- මිල මුදල් ආදිය විනාශ නොකිරීම
- දක්ෂව අනලස්ව සියලු කටයුතු කිරීම

මෙසේ අඹු-සැමි දෙපක්ෂය ම ක්‍රියා කරන විට පවුල් ජීවිතය තුළ දෙපක්ෂයේ ම අයිතීන් සුරක්ෂිත වේ. එවිට සංතෘප්තිමත් ජීවන අවස්ථාවක් උදා වේ. එය සමස්ත සමාජයට ම ආදර්ශයකි.

කරුණු 10ම ලියා තිබේනම් = ලකුණු 08යි

කරුණු 07-09 ලියා තිබේනම් = ලකුණු 07යි

ඊට අඩුනම් නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු ලබා දෙන්න

3.

(i)

- රස පඨවි
- භූමි පප්පටක
- බදාලතා
- සයංජාත හැල්

(01×4 = ලකුණු 04යි.)

(ii)

- ලෝලත්වය = රස තෘෂ්ණාව - රස පෘථිවිය ඇගිල්ලෙන් ස්පර්ශ කොට දිව ගා බැලීම
- දිට්ඨානුගතිය = එය දුටු සෙස්සෝද දිට්ඨානුගතියට පත්වීම හෙවත් එය අනුකරණය කිරීම
- අලසකම = කම්මැලිකම, කුසගිනි දැනෙන විට කඩාගෙන කෑමට තිබූ දේ අලසකම නිසා දෙවේලට, තුන්වේලට හා දින කිහිපයකට සැහෙන පරිදි එකවර කඩා ගැනීම
- සන්නිධිකාර පරිභොජනය = ස්වයංජාත හැල්, කම්මැලිකම නිසා දෙතුන් වේලට හා දින දෙකකට, තුනකට ආදී ලෙස එකවර කඩාගෙන රැගෙන ගොස් රැස්කොට තබාගෙන පරිභෝජනය කිරීම

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 02 බැගින් කරුණු 3ක් සඳහා 02×3 = ලකුණු 06යි.)

(iii)

- මහා සම්මත = මහාජන සම්මතොති ඛො වාසෙට්ඨ මහා සම්මතො
  ජනතාවගේ සම්මතයෙන් තෝරාපත්කරගත් බැවින්
- ඛත්තිය = ඛෙත්තානං අධිපතීති ඛො වාසෙට්ඨ ඛත්තියො
  කෙත්වතුවලට අධිපතිව ඒවායේ නිසි පරිහරණය සහතික කරන නිසා
- රාජා = පරං රඤ්ජෙතීති ඛො වාසෙට්ඨ රාජා
  ධර්මයෙන් අනුන්ගේ සිත් රංජනය (සතුටු) කරන නිසා

* හෙළාදැකිය යුත්තන් හෙළාදැක, හැරහිය යුත්තන් ගරහා, පිටුවහල් කළ යුත්තන් පිටුවහල් කොට ක්‍රියාකරන්නට සමවර්ථ තැනැත්තෙකු විය යුතුය.
* යුක්තිය පසිදලීම, දේපළ අයිතිය තහවුරු කිරීම, යුක්ති සහගත ජීවන පැවැත්මක් තහවුරු කිරීම, රජුගේ මූලික කාර්ය භාරය වේ.

මේ ඇසුරින් පිළිතුර සකස් විය යුතුය.

රාජ්‍ය ප්‍රභවය දැක්වීමට = ලකුණු 04යි

කාර්යභාරය විචාරයට ලක් කිරීමට = ලකුණු 04යි

ලකුණු 08යි

4.

(i)

- වාතය
- සෙවණ
- ආරක්ෂාව
- ආහාරපාන
- ඖෂධ
- වස්ත්‍රාභරණ

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4ක් සඳහා 01×4 = ලකුණු 04යි.)

(ii)

- තසා - තෘෂ්ණා භය සහිත තැතිගන්නා සත්ත්වයෝ
- ථාවරා - තෘෂ්ණා භය ප්‍රහීණ කළ ස්ථාවර සත්ත්වයෝ
- දීඝා - නාගාදී දික් ශරීර ඇත්තෝද
- මහන්තා - මත්ස්‍ය, හස්ති, අසුර ආදී මහත් ශරීර ඇත්තෝද
- මජ්ඣිමා - අශ්ව, ගව මහීෂාදි මධ්‍යම ප්‍රමාණ ශරීර ඇත්තෝද
- රස්ස - වාමනාදී මිටි ශරීර ඇත්තෝද
- අණුක - පියවි ඇසට නොපෙනෙන සියුම් ශරීර ඇත්තෝද
- ථූලා - මස්, කැසුබු ආදී ස්ථූල ශරීර ඇත්තෝද
- දිට්ඨා - ඇස් හමුවට පැමිණීම් ලෙස දුටු සත්ත්වයෝ
- අද්දිට්ඨා - ඇත සිටි බැවින් නොදුටු සත්ත්වයෝ
- දූරෙ වසන්ති අවිදූරෙ - දුරත් ළඟත් වසත් නම් ඔවුහුද
- භූතා - ඉපදීම අවසන් කළ ක්ෂීණාශ්‍රවාදිහුද
- සම්භවේසී- මතු ඉපදීම සොයන ශෛක්ෂ, පෘථග්ජන සත්ත්වයෝද

(නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 6ක් සඳහා 01×6 = ලකුණු 06යි.)

(iii)

- ප්‍රාණඝාත විරමණ ශික්ෂාවේ විරමණ හා සමාදාන යන අංශ දෙක
- මහා පරිනිබ්බාන සූත්‍රයෙහි පරිසර රමණීයත්වය පිළිබඳ ප්‍රකාශන
- කරණීයමෙත්ත සූත්‍රයෙහි
  සුඛිනෝවා ඛේමිනෝ හොන්තු
  සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා - සත්ව ප්‍රභේද දක්වමින් ඉදිරිපත් කරන විශ්ව මෛත්‍රී සංකල්පය
- ථෙරගාථා, ථෙරී ගාථා, උදාන ආදියෙහි පරිසර චමත්කාරය
- විරාගී දර්ශනය තුළ පරිසර දැක්ම
- වනරෝප සූත්‍රය
- විනය පිටකාගත පරිසරයේ ජලයට කෙළ ගැසීම, මළ මූත්‍ර එකතු කිරීම පචිති ඇවතක් ලෙස දැක්වීම
- ස්වාභාවික පරිසරය, ජලය, වාතය, හිරුඑළිය, පොළොව, පස ආදිය දූෂණය නොකිරීම
- මානව වර්ගයා වෙත මෛත්‍රිය පැතිර වීම
- භූතාවා සම්භවේසීවා - උපන්, උපතට සුදානම් සත්වයන් කෙරෙහිද
- සබ්බේ සත්තා භවන්තු සුඛිතා - සියලු සත්වයෝම සුව ඇත්තෝ වෙත්වා යැයි වඩන විශ්ව මෛත්‍රීය ආදී කරුණු

මේ අතරින් කරුණු 4ක් වත් පදනම් කොට පිළිතුරු සකසා තිබිය යුතුය.

(නිවැරදි කරුණකට ලකුණු 02 බැගින් කරුණු 4ක් සඳහා 02×4 = ලකුණු 08යි.)

5.

(i)

- ජීවත්වීමේ අයිතිය
- නිදහසේ හැසිරීමේ අයිතිය
- කැමති බසක් කථා කිරීමේ අයිතිය
- කැමති ආගමක් ඇදහීමේ අයිතිය
- කැමති වෘත්තියක් ඉටු කිරීමේ අයිතිය
- කැමති තැනක ජීවත් වීමේ අයිතිය (භූමිය තෝරා ගැනීම)
- [illegible]

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4ක් සඳහා 01×4 = ලකුණු 04යි.)

(ii)

- මිනිසා සහජයෙන්ම නිදහස් සත්වයෙකි
- මිනිසාත් සමාජයත් ප්‍රතීත්‍යසමුත්පන්නය යන සංකල්ප දෙකකි
  මේ ඇසුරින් කෙටි විවරණයක් තිබිය යුතුවේ

(03×2 = ලකුණු 06යි.)

(iii)

- පාණාතිපාතා පටිවිරතො හොති නිහිත දණ්ඩො නිහිත සත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණ භූත හිතානුකම්පි විහරති

  ප්‍රාණඝාතයෙන් වැළකුණේ වෙයි, දඬු මුගුරු බැහැර කළේ වෙයි, අවි ආයුධ බැහැර කළේ වෙයි, පාපයට ලැජ්ජා ඇත්තෝ වෙති, දයාවෙන් යුක්ත වෙයි, සියලු ප්‍රාණීන්, භූතයන් විෂයෙහි හිතානුකම්පා ඇත්තෝ වෙයි

- අදින්නාදානා පටිවිරතොහොති.....

  නුදුන් දෑ ගැනීමෙන් වැළකුණේ වෙයි, දුන් දෙයම ගන්නෝ වෙයි, සොරසිතින් නැතිව පිරිසිදු සිතින් යුක්තව වාසය කරයි

- කාමේසු මිච්ඡාචාරා පටිවිරතො හොති.....

  කාමමිථ්‍යාචාරයෙන් වැළකුණේ වෙයි

- මුසාවාදා පටිවිරතොහොති.....
  බොරුකීමෙන් වැළකුණේ වෙයි

- සුරාමේරය මජ්ඣපමාදට්ඨානා පටිවිරතො හොති.....
  මදයට හා ප්‍රමාදයට හේතුවන සුරාපානයෙන් වැලකුණේ වෙයි

පඤ්චශීල ප්‍රතිපත්තිය ඇසුරින් පිළිතුර සපයා තිබිය යුතුය

ශික්ෂාපද කරුණු පහම දක්වා පිළිතුර සකසා තිබේනම් = ලකුණු 08යි.

ශික්ෂාපද කරුණු හතරක් දක්වා පිළිතුර සකසා තිබේනම්= ලකුණු 07යි.

ශික්ෂාපද කරුණු තුනක් දක්වා පිළිතුර සකසා තිබේනම් = ලකුණු 06යි.

6.

(i)

- කෘෂිකර්මාන්තය (කසී)
- වාණිජ කටයුතු (වණිජ්ජ)
- ගව පාලනය (ගොරක්ඛ)
- රාජ්‍ය සේවය (රාජපොරිස)
- ශිල්ප කර්මාන්තය (සිප්පඤ්ඤතර)
- හමුදා සේවය (ඉස්සත්ථ)

(මේ අතරින් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4ක් සඳහා 01×4 = ලකුණු 04යි.)

Past Papers Wiki

(ii)

- සුරාපානය හා මත්ද්‍රව්‍ය භාවිතය
- අවේලාවේ වීථි සංචාරය
- මද්‍ය පානෝත්සව හා සමාජශාලා (සමජ්ජාභිචරණ) වෙත යෑම
- සූදු ලෝලත්වය
- පාපමිත්‍ර ආශ්‍රය
- අලසකම

මේ අසුරින් කරුණු කෙටියෙන් පැහැදිලි කරමින් පිළිතුර සකසා තිබිය යුතුය

(නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 6ක් සඳහා 01×6 = ලකුණු 06යි.)

(iii)

- සමජීවිකතා - අයවැය සමව පවත්වා ගැනීම

ව්‍යග්ඝපජ්ජය, මේ ලෝකයෙහි කුල පුත්‍රයා භෝගයන්ගේ අයද දැන, භෝගයන්ගේ වැයද දැන, ඉතාමහත්ද නොවූ, ඉතා පහත්ද නොවූ සම දිවි පැවැත්ම කරයි. මේ ලෙසින් මාගේ අයවැය ගෙවා සිටින්නේය. මාගේ වැය අය ඉක්මවා නොයන්නේ යැයි කියයිද මෙය සමජීවිකතාවයි. මෙහි අංශ තුනකි.

* පරිභෝජනය

* සංවිභජනය

* සංරක්ෂණය

මේ කරුණු තුන ඇසුරින් කරුණු දක්වා තිබීම.

- ඉත්ථිධුත්ත, සුරාධුත්ත, අක්ඛධුත්ත යන ධූර්තභාවයට පත් නොවීම.
- අති විභූෂණය හෝ විෂම ලෝභය වැනි අන්තවලට නොවැටීම
- ශක්ති පමණින් තම සමාජ යුතුකම් ඉටු කිරීම
- තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම

සමස්තයක් සේ සලකා ලකුණු දෙන්න

(ලකුණු 08)

7.

(i)

- සිගාලක සූත්‍රය
- මංගල සූත්‍රය
- පරාභව සූත්‍රය
- වසල සූත්‍රය
- කරණීයමෙත්ත සූත්‍රය
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
- පත්තකම්ම සූත්‍රය

ආදී සූත්‍ර අතරින් හතරකි.

(නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4ක් සඳහා 01×4 = ලකුණු 04යි.)

PAST PAPERS WIKI

Past Papers Wiki

(ii)

- සද්ධා - ශ්‍රද්ධාව
- සීල - ශීලය
- චාග -ත්‍යාගශීලි බව
- පඤ්ඤා - ප්‍රඥාව

යන හතර ඉතා උසස් ගුණධර්ම වේ.

මේවා,

- සමසද්ධා - සමාන ශ්‍රද්ධාව
- සමසීලා - සමාන ශීලය
- සමවාගා - සමාන පරිත්‍යාගය
- සමපඤ්ඤා - සමාන ප්‍රඥාව (අවබෝධය)
- විවාහක පති - පතිනි දෙපළ තුළ පවතින්නේ නම් එම විවාහය සාර්ථක වන බව පෙන්වා දෙයි

මේ ඇසුරින් පිළිතුරු සකස් විය යුතුයි.

කරුණු 4 දක්වීමට - ලකුණු 04යි

කෙටි පැහැදිලි කිරීමට - ලකුණු 02යි

ලකුණු 06

(iii)

- සිගාලක සූත්‍රයෙහි සදිසා සංකල්පයට අයත් පශ්චිම දිශාව ස්වාමියා - භාර්යාව අතර පැවතිය යුතු අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් රාශිය
- නකුලමාතා හා නකුලපිතු සූත්‍රයෙහි සඳහන් ඔවුනොවුන්ගේ හැඟීම් ප්‍රකාශන
- සංයුක්ත නිකායේ වවාලාත සූත්‍රයේ,
  වවෝ වවාය සද්ධිං සංවසති
  වවෝ දෙවියා සද්ධිං සංවසති
  දෙවෝ වවාය සද්ධිං සංවසති
  දෙවෝ දෙවියා සද්ධිං සංවසති

  මෙහි, වව - රූපකයත්, දෙව - රූපකයත්, විවාහක ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ආධ්‍යාත්මික දියුණුව හා පරිහානිය ප්‍රකාශිත යෙදුම් ලෙස සාකච්ඡා කොට තිබීම.

මේ කරුණු ඇසුරින් පිළිතුරු සකසා තිබිය යුතුය. සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න

(ලකුණු 08යි)

PAST PAPERS WIKI

****

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library